# ලංකා බැංකුව

**ලංකා බැංකුව යනු ලන්ඩනයේ බැංකු අනුබද්ධිත ආයතනයක් ඇතුළු විදෙස් රටවල් ගණනාවක ක්‍රියාත්මක වන, දිවයින පුරා ශාඛා ජාලයක් ඇති ශ්‍රී ලංකාවේ විශාලතම බැංකුවයි.**

ලොව ප්‍රමුඛ පෙළේ බැංකු 1000 අතරට ශ්‍රේණිගත කර ඇති එකම ශ්‍රී ලාංකික බැංකුව මෙන්ම ලංකාවේ අංක 01 බැංකුව වන අප පහත සඳහන් තනතුර සඳහා පවතින පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම් ඇති පළපුරුදු පුද්ගලයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## ආරක්ෂක සහායක (පුරුෂ / ස්ත්‍රී)
## (කොන්ත්‍රාත් පදනම)

### යෝග්‍යතා නිර්ණායක

- ශ්‍රී ලාංකීය පුරවැසියකු විය යුතුය.
- අ.පො.ස. (සා/පෙළ) විභාගයේදී විෂයයන් පහක් (05) එකවර සමත් වී තිබීම.
- ශ්‍රී ලංකා යුද හමුදාවේ ලාන්ස් කෝප්‍රල් / ශ්‍රී ලංකා නාවික හමුදාවේ බල නැවි / ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ නායක ගුවන් භට හෝ ශ්‍රී ලංකා පොලිස් සේවයේ පොලිස් කොස්තාපල්වරයකු (මූලික අතුරු හමුදා නිපුණතා සමග) හෝ ඊට ඉහළ තනතුරක් දැරීම
- ත්‍රිවිධ හමුදාවේ හෝ පොලිසියේ අවම වශයෙන් වසර පහක (05) (අඛණ්ඩ) සේවා කාලයක් සහිත නීත්‍යානුකූලව සේවයෙන් ඉවත් වූ අයෙක් වීම. වාණිජ බැංකුවක ආරක්ෂක සහායකයෙකු / ආරක්ෂක නිලධාරියකු ලෙස වසරකට වැඩි පළපුරුද්දක් ඇති තැනැත්තන් වෙත ප්‍රමුඛතාව දෙනු ලැබේ.
- සැහැල්ලු වාහන සහ යතුරු පැදි පැදවීම සඳහා වලංගු රියදුරු බලපත්‍රයක් සතුවීම.
- උස – පුරුෂ අයදුම්කරුවන් – අඩි 5 අඟල් 4ක් හෝ ඊට වැඩි විය යුතුය.<br>ස්ත්‍රී – අයදුම්කරුවන් – අඩි 5 අඟල් 2ක් හෝ ඊට වැඩි විය යුතුය.
- අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 35ට අඩු විය යුතුය.

### වෙනත් විශේෂ සුදුසුකම්

- ගිනි ආරක්ෂණ කටයුතු, බෝම්බ නිෂ්ක්‍රිය කිරීමේ කටයුතු, ආත්මාරක්ෂක සටන් ක්‍රම සහ නව ආරක්ෂක උපකරණ භාවිතය පිළිබඳ කුසලතාව තිබීම
- ක්‍රීඩා/ මලල ක්‍රීඩාවල නිරත වී තිබීම
- ඉංග්‍රීසි දැනුම හා අන්තර් පුද්ගල කුසලතා තිබීම

### නියමයන් හා කොන්දේසි

- මෙම තනතුර කොන්ත්‍රාත් පදනමින් වසර දෙකක (02) කාලසීමාවක් සඳහා වේ
- වසර දෙකක (02) කොන්ත්‍රාත් කාලසීමාව සාර්ථකව නිම කිරීමෙන් පසු අයදුම්කරු සුදුසුයැයි හැඟී ගියහොත් ස්ථිර මණ්ඩලයට අන්තර් ග්‍රහණය කිරීම සඳහා සලකා බැලීමට සුදුසුකම් ලබයි.
- කොන්ත්‍රාත් කාලසීමාව තුළ මාසික දීමනාවක් (1 වන වසර සඳහා– රු. 42,000/– සහ 2 වන වසර සඳහා– රු.52,000/– බැගින්) ගෙවනු ලැබේ.
- බැංකුවේ අවශ්‍යතාව අනුව දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සූදානම් විය යුතුය.
- සාමාන්‍ය කාර්යාල වේලාවෙන් පසුව, සති අන්ත / නිවාඩු දිනවල සේවය කිරීම අපේක්ෂා කෙරේ.

### තෝරාගැනීමේ පටිපාටිය

ඉහත දක්වූ යෝග්‍යතා නිර්ණායකයන්ට අනුව කෙටි ලැයිස්තු ගත කරනු ලබන අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයක් සහ ඉන් අනතුරුව පැවැත්වෙන වෛද්‍ය හා ශාරීරික යෝග්‍යතා පරීක්ෂණයන් මගින් තෝරාගනු ලැබේ.

### අයදුම් කිරීමේ පටිපාටිය

අපගේ වෙබ් අඩවිය වන www.boc.lk (“careers” තීරය) යටතේ බාගත හැකි ආදර්ශ අයදුම්පත භාවිතයෙන් සකසන ලද ඔබගේ ජීවදත්ත පත්‍රිකාව, උප්පැන්න සහතිකයේ, ජාතික හැඳුනුම්පතේ, රියදුරු බලපත්‍රයේ, අදාළ සියලුම අධ්‍යාපනික හා වෘත්තීය සහතිකපත්වල සහ ඔබේ වර්තමාන තනතුර සහ පළපුරුද්ද සනාථ කිරීමේ සහතික/ ලේඛනගත සාක්ෂිවල ඡායාස්ථ පිටපත් හා සේවයෙන් මුදාහැරීමට අදාළ සහතික/ ලේඛනගත සාක්ෂි, අයදුම්කරු ක්‍රියාකාරී සේවයේ සිටින්නේ නම් හා ඔහුව/ ඇයව තෝරාගනු ලැබුවහොත් සේවයෙන් මුදාහැරීමේ හැකියාව සනාථ කරමින් ප්‍රධානියාගෙන් ලබාගත් ලිපියක් සමග **2025 මැයි මස 03** වන දින හෝ ඊට පෙර අප වෙත ලැබෙන සේ පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතු අතර, අයදුම්පත බහා එවන ලියුම් කවරයේ වම් පස ඉහළ කෙළවරේ ඔබ අයදුම් කර ඇති තනතුර ද සඳහන් කළ යුතුය.

අයදුම්පත් භාරගන්නා අවසන් දිනට ඉහත නියමිත යෝග්‍යතා නිර්ණායක සපුරා නොමැති හෝ අදාළ සනාථ කිරීමේ ලේඛනවල ඡායාස්ථ පිටපත් නොමැතිව හෝ සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කරන හෝ අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පසුව එවන යම් අයදුම්පතක් කිසිදු දැනුම්දීමකින් තොරව බඳවාගැනීමේ ඕනෑම අදියරකදී ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්කරු විසින් අපගේ වෙබ් අඩවියේ https://www.boc.lk/hr-management ඔස්සේ පිවිසිය හැකි මානව සම්පත් කළමනාකරණ පිටුවේ ඇති “බඳවාගැනීම් සඳහා වන පෞද්ගලික දත්ත ආරක්ෂණ දැන්වීම” ඉල්ලුම් කරන අවස්ථාවේදී කියවා අවබෝධ කර ගත යුතුය.

**ප්‍රධාන කළමනාකරු (බඳවාගැනීම් හා වෘත්තීය සංවර්ධන),**<br>
**ලංකා බැංකුව,**<br>
**26 වන මහල - ප්‍රධාන කාර්යාලය,**<br>
**“ලංකා බැංකු චතුරශ්‍රය”,**<br>
**අංක 1, ලංකා බැංකු මාවත, කොළඹ 01.**

- බැංකුව වෙත කිසිම ආකාරයක බලපෑමක් කිරීම මෙම තනතුර සඳහා වහාම නුසුදුසුභාවයට පත්කිරීමට හේතුවේ.
- තෝරාගනු ලබන අයදුම්කරුවන් පමණක් කැඳවීමේ අයිතිය බැංකුව සතුය.
- පිරවිය යුතු තනතුරු සංඛ්‍යාව තීරණය කිරීමේ හෝ බඳවාගැනීම කල්දැමීමේ/ අවලංගු කිරීමේ අයිතිය බැංකුව සතුය.
- බැංකුවේ පෞද්ගලික දත්ත ආරක්ෂණ ප්‍රතිපත්තියට අනුව, බැංකුව විසින් ඔබේ තොරතුරුවල පෞද්ගලිකභාවය හා රහස්‍යභාවය ආරක්ෂා කරනු ලැබේ.

1975 BOC CALL CENTRE
www.boc.lk
AA-(lka) Fitch ශ්‍රේණිගත කිරීම AAA Brand Finance ශ්‍රේණිගත කිරීම.
ලංකා බැංකුව, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අධීක්ෂණය කරනු ලබන බලපත්‍රලාභී වාණිජ බැංකුවකි.
යෝජනා/අදහස්/පැමිණිලි සඳහා - https://www.boc.lk/contact
ප්‍රධාන කාර්යාලය, BOC චතුරශ්‍රය,
අංක 1, ලංකා බැංකු මාවත, කොළඹ 1.
ලංකා බැංකුව BOC
ජාතියේ මහා පහන් ටැඹ